**අතුරලිය ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජූලි 15 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 නොවැම්බර් 25 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට අතුරලිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභාව සතු කෝරළගෙහේන නැමැති ඉඩමේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සභාව ස්ථාපිත කිරීමේදී පවරාගත් සභා දේපල සඳහා අකුරැස්ස ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු මුදල රු.84,933 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඇ) සභා පරිශ්‍රයේ රථගාල ඉදිකිරීම සඳහා දරන ලද වියදම රු.105,231 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.15,091,249 ක් වූ විවිධ ණයගැති ශේෂයට අවුරුදු 03 ක කාලය ඉක්මවා තිබුණු රු.223,043 ක ශේෂ 05 ක් ඇතුළත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.6,657,140 ක් වූ විවිධ ණයහිමි ශේෂයට අවුරුදු 03 ක කාලය ඉක්මවා තිබුණු රු.150,000 ක ශේෂ 02 ක් ඇතුළත් වී තිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු.20,808,431 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු හා වත්කම් ලේඛනද, එකතුව රු.73,917,955 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ මෝටර් රථ හා කරත්ත සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයද, රු.6,087,818 ක් වූ කර්මාන්ත ණයගැතියන් සහ රු.6,237,769 ක් වූ ණයහිමියන් සම්බන්ධයෙන් ණයගැති හා ණයහිමි ලේඛන මෙන්ම ශේෂ සනාථ කිරීම් යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම්

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 261(3) ට අනුකූල නොවී මුදල් පොතේ ප්‍රමාණවත් ශේෂයක් නොමැතිව තිබියදී එකතුව රු.1,120,137 ක් වූ චෙක්පත් 07 ක් නිකුත් කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.6,182,783 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.5,229,520 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.953,263 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විශ්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් රු.5,444,536 කින් වැඩි වී තිබුණි. එමෙන්ම මුළු පුනරාවර්තන ආදායමින් සියයට 80 ක් ඉක්මවා පුනරාවර්තන වියදම් පැවැතීම නිසා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් ආදායම් සභාව සතුව නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ සභාවේ ආදායම් ආධාර, ස්වයං උත්පාදන ආදායම් සහ මුළු පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| **වර්ෂය** | **මුළු පුනරාවර්තන ආදායම්** | **ආදායම් ආධාර** | **ස්වයං උත්පාදිත ආදායම්** | **මුළු පුනරාවර්තන වියදම්** | **ස්වයං උත්පාදිත ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම්** |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 31,989,945 | 20,633,843 | 11,356,102 | 25,807,161 | (14,451,059) |
| 2014 | 25,592,144 | 17,226,537 | 8,365,607 | 20,362,625 | (11,997,018) |
| 2013 | 17,030,152 | 9,996,354 | 7,033,798 | 16,862,636 | (9,828,838) |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ සභාවේ ආදායම් ආධාර වල වර්ධනයක් මෙන්ම ස්වයං උත්පාදන ආදායම් වලද සාමාන්‍ය වැඩිවීමක් සිදුවී තිබුණි.

(ii) සෑම වර්ෂයකම පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් සැලකිය යුතු අගයන්ගෙන් වර්ධනය වී ඇති නමුත්, එම තත්ත්වය පාලනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(iii) සභාවේ ස්වයං උත්පාදන ආදායම ඉක්මවා වර්ෂ තුනෙහිම සැලකිය යුතු අගයන්ගෙන් පුනරාවර්තන වියදම් වැඩිවී තිබුණි.

(iv) ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ස්වයං උත්පාදන ආදායම් වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට කිසිදු ආකාරයකින් හැකියාවක් නොලැබෙන බව ඉකුත් වර්ෂ තුන තුළම පෙන්නුම් කෙරුණි.

(v) ඉහත අංක (i) සිට (iv) දක්වා ඡේදවල දැක්වෙන කරුණු අනුව ආදායම් තත්ත්වය ඉහළ නංවා ගැනීමට සභාවේ අවධානය යොමුවිය යුතුව ඇති බවත්, ඒ සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු බවත්, එසේ නොමැති වුවහොත් සභාවේ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයක් උද්ගත විය හැකි බවත්, එමඟින් සභාවේ අඛණ්ඩ පැවැත්මට අහිතකර බලපෑම් එල්ලවිය හැකි බවත් නිරීක්ෂණය කරනු ලැබේ.

**2.3 ආදායම් පරිපාලනය**

-----------------------

**2.3.1 වරිපනම් හා බදු**

-------------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භයට හිඟ ශේෂය රු.582,003 ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.668,326 ක් විය. හිඟ ශේෂයෙන් සියයට 25 ක් හා බිල්කිරීම් වලින් සියයට 40 ක් අයකරගෙන තිබුණි. හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.24,650 ක් හා මුද්දර ගාස්තු වෙනුවෙන් රු.7,641,937 ක් ලැබිය යුතුව තිබුණි.

**2.3.3 පරිසර බලපත්‍ර**

------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන ආයතන / කර්මාන්ත 43 ක් සඳහා පරිසර බලපත්‍ර නිකුත් නොකිරීම නිසා රු.189,200 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 කාර්ය සාධන ඇගයීම**

-------------------------

සමාලෝචිත වර්ෂයේදී සංවර්ධන වැඩ යෝජනා 216 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු නමුත්, ක්‍රියාත්මක කර තිබුණේ යෝජනා ක්‍රම 06 ක් පමණි. කෙසේ වුවද, රු.1,000,000 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත සංඛ්‍යාව ඉක්මවා 11 දෙනෙකු සේවයේ යොදවා තිබුණු නමුත්, එම තනතුරු විධිමත් කර ගැනීමට මෙන්ම අනුමත තනතුරු 02 ක පැවැති පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

### 4.1 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් ආදායම් විෂයයන් 04 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් රු.775,279 ක්ද, තවත් ආදායම් විෂයයන් 03 ක අයවැයගත සීමාව ඉක්මවා රු.6,233,123 ක ආදායම්ද, වියදම් විෂයයන් 04 ක රු.1,470,109 ක් වූ ඉතිරි කිරීම්ද පැවතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

-------------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ච.ලේ දරන පළාත් පාලන කොමසාරිස් (දකුණු පළාත) ගේ චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු නමුත්, පත්කර තිබුණු අභ්‍යන්තර විගණන නිලධාරියාට සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.430,728 ක් ගෙවා තිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටුව

----------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

### 4.4 වත්කම් කළමනාකරණය

------------------------------

වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

---------------------------------

සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ භාණ්ඩ ඌණතාවයන්හි ගණනය කළහැකි වටිනාකම රු.286,513 ක් වී තිබුණි.

## 5. පද්ධති හා පාලනය

-----------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන  ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) වත්කම් කළමනාකරණය
(ආ) ගිණුම්කරණය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) අයවැය පාලනය
(ඉ) මූල්‍ය පාලනය